# (ඌ) කාර්මික සංවර්ධනයෙහි ප්‍රධාන ලක්ෂණ

1961 ලංකාවේ කාර්මික සංවර්ධනය පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යා තොරතුරු නොමැති නිසා එහි වර්ධනයෙහි ස්වරූපය හා වේගය ගැන නිවැරදි තොරතුරු සැපයීම උගහට වූයේ වී නමුත් මේ කාලය තුළ කාර්මික සංවර්ධනයෙහි ඇති වූ සැලකිය යුතු ලක්ෂණ කීපයක් සොයාගත හැකිය. මේ ලක්ෂණ අනුව, මෙතෙක් රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කැරුන ආයෝජන වල ප්‍රතිඵල වශයෙන් කෙමෙන්, කෙමෙන්, රටේ කාර්මික සැකැස්මෙහි සාමාන්‍ය පුළුල් වීමෙක් සහ විවිධත්වයක් ඇතිවනවා පමණක් නොව, කාර්මික සංවර්ධන සඳහා අවශ්‍ය මූලික පදනම ශක්තිමත් වන බව දක්ක හැකිය. එසේම පෞද්ගලික අංශය මගින් කර්මාන්ත ඇරඹීමෙහි ලා අලුත් උද්‍යෝගයක් ද පෙන්වයි.

### රාජ්‍ය අංශය

රාජ්‍ය අංශයෙහි දැනට පවත්නා සමාගතනයන්හි වැඩ කටයුතු රජය විසින් මේ වර්ෂය තුළදී සමාලෝචනය කරන ලදී. එම සමාලෝචනයෙන් පසු සමාගතනයන්හි කාර්යක්ෂමතාව දියුණුකිරීම සඳහා පියවර කිහිපයක්ම ගන්නා ලදී. පළමුවෙන්ම සමාගතන කීපයක්ම නැවත වර්ග කොට එහි කළමනාකාරත්වය එකම පාලන ඒකකයක් යටතට පත් කැරිණි. මෙසේ කරන ලද්දේ පොදු කාර්ය ගාස්තු අඩු කිරීමටත්, පාලන කාර්ය මණ්ඩල හිඟකමින් ඇති වන දුෂ්කරතා මග හැරවීමටත්ය. උදාහරණයක් වශයෙන් පරන්තන්හි රසායන හා ලුණු සමාගතනය ඒකාබද්ධ කරන ලදී. දෙවැනිව පවත්නා පාලන කාර්ය මණ්ඩලයන් තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා පිටරටින් විශේෂඥයන් ගෙන්වා ගන්නා ලදී. පෙරදිග කඩදාසි කම්හල සම්බන්ධයෙන් මෙසේ කරන ලද්දේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහාය. සමහර සමාගතනයන්හි පුළුල් කිරීමේ වැඩ පිළිවෙලවල් සකස් කරන ලදී. සමහරෙක ඒවා ක්‍රියාත්මක කරන ලදී. නිෂ්පාදන හා අනෙකුත් ඉලක්ක සපුරා ගැනීමේ අදහසින් රජය සමාගතන වල කටයුතු පිළිබඳව දැඩිලෙස පරීක්ෂා කාරීවිය. මෙම විධිවිධාන නිසා, සමහර පැරණි සමාගතනයන්හි නිෂ්පාදනය වැඩි වී ඇති අතර සමහරකින් ලාබ පවා ලැබේ.

11–53 සටහනෙන්, රාජ්‍ය අංශයෙහි කාර්මික නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා දැක්වෙයි.

සිමෙන්ති නිෂ්පාදනය පිළිබඳ වැදගත් දියුණුවක් ලෙස සැලකිය හැක්කේ පුළුල් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කොට එය ක්‍රියාත්මක කිරීමයි. මෙම පුළුල් කිරීමේ වැඩ පිළිවෙළ අවස්ථා තුනකින් සමන්විතය.

(1) කන්කසන්තුරේ දැනට පවත්නා ස්ථානයෙහි ම දෙ වැනි පෝරණුවක් පිහිටුවීම.

(2) ගාල්ලෙහි සිමෙන්ති ගල් ඇඹරුම්කම්හලක් පිහිටුවීම.

(3) පුත්තලමෙහි යෝග්‍ය අමුද්‍රව්‍ය ලබාගත හැකි ස්ථානයක තවත් සිමෙන්තිකම්හලක් පිහිටුවීම.

පළමු වැනි අවස්ථා දෙක සඳහා යන වියදම රුපියල් හාර කෝටියක් පමණ වෙයි. මේ මුදල බටහිර ජර්මනියෙන් ණයට ගනු ලැබේ. දැනට වාර්ෂික ව සාමාන්‍යයෙන් සිමෙන්ති ටොන් 80, 000 ක් පමණ නිපදවනු ලැබේ. මෙය දැනට මෙරටට අවශ්‍ය ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණය. තිබෙන කම්හල පුළුල් කිරීමෙන් පසු සිමෙන්ති නිෂ්පාදනය ටොන් 2,50,000කට වැඩි වෙයි. දෙ වැනි කම්හල නිම කිරීමෙන් පසු තවත් ටොන් 2,00,000 ක් පමණ නිපදවිය හැකිය. දෙවැනි කම්හල සඳහා යන වියදම රුපියල් පත් කෝටියකි. මේ සඳහා විදේශීය ණය ලබා ගැනීමට හැකිදැයි දැනට සොයා බලනු ලැබේ.

සංඛ්‍යා සටහන II—53

# රජයේ කාර්මික සංයුක්ත මණ්ඩල

| නම | පිහිටුවන ලද්දේ | ප්‍රාග් ධනය රුපියල් දශලක්ෂ | නිෂ්පාදනය කරන ද්‍රව්‍ය | නිෂ්පාදනය: ඒකකය | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. "ඊස්ටන් පේපර් මිල්ස්" | 1955 | 22·0 | කඩදාසි | ටොන් | 736 | 1,379 | 1,235 | 4,187 | 4,563 | 2,545(1) | |
| 2. ලංකා තෙල් හා ඛනිජ .. | 1955 | 19·8 | පොල්තෙල් හා | ටොන් | 1,234 | 3,426 | 6,678 | 7,477 | 8,112 | 10,459 | |
| | | | සත්වාහාර | ටොන් | 111 | 1,800 | 4,700 | 3,422 | 11,723 | 23,607 | |
| 3. ලංකා පිඟන් මැටි .. | 1955 | 3·0 | පිඟන් භාණ්ඩ | ටොන් | 201 | 338 | 368 | 425 | 466 | 480 | |
| 4. ලංකා තුනී ලෑලි .. .. | 1956 | 2·8 | වෙලු 3 නේ තුනීලෑලි | හතරැස් අඩි | 5,578,621(2) | 7,591,767 | 6,877,675 | 8,309,077 | 9,288,514 | 11,271,523 | |
| 5. ඩී. අයි. සම් නිෂ්පාදනය | 1956 | 1·7 | පාවහන් හා සම්භාණ්ඩ | සම්මත පිරිවැය අනුව නිෂ්පාදනයෙහි වටිනාකම රුපියල් | 637,692(3) | 1,012,212 | 1,278,256 | 367,488(4) | 1,358,454(5) | 1,523,035(6) | |
| 6. පරන්තන්හි රසායන | 1956 | 15·7 | කෝස්ටික් සෝඩා | ටොන් | — | — | — | — | 78·4 | 666 | |
| 7. ලංකා සිමෙන්ති | | | | ටොන් | 83,371 | 48,195 | 79,079 | 93,463 | 83,623 | 80,471 | |
| සංයුක්ත මණ්ඩලය .. | 1956 | 26·8 | සිමෙන්ති | ටොන් | — | — | — | — | 6,264 | 3,832 | |
| 8. ඛනිජ වැලි .. .. | 1957 | 8·0 | ඉල්මනයිට් | ටොන් | — | — | — | — | 215 | 306 | |
| 9. කන්තලේ සීනි .. | 1957 | 28·0 | සීනි | ටොන් | — | — | — | — | 319 | 155 | |
| | | | උක් පැණි | | | | | | | | |
| 10. ජාතික ලුණු .. .. | 1957 | 14·0 | ලුණු | ටොන් | — | — | — | 4,164 | 11,233 | නිෂ්පාදනය නැත. | |
| 11. ජාතික රෙදිපිළි .. | 1958 | 41·1 | නූල් | රාත්තල් | — | — | — | — | — | 423,324 | |
| 12. ජාතික සුළු කර්මාන්ත | 1959 | 5·6 | | | | | | | | | ගඩොල් හා උළු සෑදීම සඳහා ඉදිකෙරෙමින් පවතින කම්හල්. |
| 13. හාඩ්බෝඩ් .. .. | 1959 | 3·0 | — | | | | | | | | ගොඩනැගිලි ඉදිකෙරෙමින් පවතී. |
| 14. කාර්මික වතු .. .. | 1960 | 2·5 | — | | | | | | | | |
| 15. යකඩ සහ වානේ සංයුක්ත මණ්ඩලය .. | 1961 | 80·0 | මූලික ආයෝජන | | | | | | | | දැනට ඉදිකෙරෙමින් පවතී. |
| 16. වයර් හා ටියුබ් සංයුක්ත මණ්ඩලය .. | 1961 | 51·7 | මූලික ආයෝජන | | | | | | | | එම |

(1) ජනවාරි සිට සැප්තැම්බර් දක්වා නව මාසයක් (2) අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා නව මාසයක් (3) අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා නව මාසයක්
(4) ජනවාරි සිට මාර්තු දක්වා තුන් මාසයක් (5) 1959 අප්‍රේල් සිට 1960 මාර්තු දක්වා වූ වර්ෂය (6) 1960 අප්‍රේල් සිට 1961 මාර්තු දක්වා වූ වර්ෂය

පිගන් සංයුක්ත මණ්ඩලයට මූලික වශයෙන් මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා දැනට මඟහැරී ගොස් ඇත. 1960 සහ 1961 අතර තුර එහි නිෂ්පාදනය ටොන් 466 සිට 480 දක්වා වැඩිවිය. මෙම සංයුක්ත මණ්ඩලයෙහි පුළුල් කිරීමේ

වැඩ පිළිවෙළට,:-

(1) රුපියල් විසි ලක්ෂයක් පමණ වැය වන දෙවැනි කම්හලක්

(2) රුපියල් අනූ ලක්ෂයක් පමණ වැය වන මැටි පිරිසිදු කිරීමේ යන්ත්‍රයක්

යන කරුණු ඇතුළත්ය. මෙම වැඩ පිළිවෙළ සම්පූර්ණ වූ පසු මෙරටට අවශ්‍ය පිඟන් භාණ්ඩ වර්ග කිහිපයකින් සවයංපොෂිත විය හැකි යයි සලකනු ලැබේ.

1959/60 කාලය හා සසඳ බලන විට, 1960/61 කාලය තුළ හම් නිෂ්පාදන සංයුක්ත මණ්ඩලයෙහි නිෂ්පාදන වටිනාකම රුපියල් 13,58,454/- ක් වී ඇති අතර 1960 අප්‍රේල් සිට 1961 මාර්තු දක්වා වූ කාලය තුළ එය රුපියල් 15,23,035 ක් වී ඇත. මෙම සංයුක්ත මණ්ඩලය එහි කටයුතු පුළුල් කිරීම සඳහා සැලසුම් කොට ඇත. මීට අවශ්‍ය යන්ත්‍රෝපකරණ, චෙකෝස්ලෝවැකියාවෙන් ගෙන්වනු ලැබේ.

තුනී ලෑලි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය, වෙලු තහඩු තුනී ලෑලි හතරැස් අඩි 92,88,514 සිට හතරැස් අඩි 1, 12,71,523 දක්වා වැඩි වී තිබේ. කලින් වර්ෂවල පාඩු විඳින්නට සිදු වූ නමුත් පසුගිය වර්ෂයේ ලාභය පෙන්වූ තවත් සංයුක්ත මණ්ඩලයක් නම්, "ඊස්ටන් පේපර් මිල්ස්" කඩදාසි සංයුක්ත මණ්ඩලයයි. මුලින් ඇස්තමේන්තු කළ නිෂ්පාදන ප්‍රමාණය ටොන් 3750 ක් වුවද, දැනට ටොන් 4000කටත් වඩා කඩදාසි මෙහි නිෂ්පාදනය කැරෙයි. මේ පුළුල් කිරීම සඳහා රුපියල් හැත්තෑලක්ෂයක මුදලක් අය-වැයෙන් වෙන් කොට ඇත. පරන්තන්හි රසායන සංයුක්ත මණ්ඩලය හා ලංකාවේ ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය වැඩ අටන් ගත්තේ 1960 පසු භාගයේ දී ය. 1961 දී රසායන සංයුක්ත මණ්ඩලය කෝස්ටික් සෝඩා ටොන් 666 ක් නිපද වූ අතර, ඛණිජ වැලි සංයුක්ත මණ්ඩලය මගින් ඉල්මනයිට් ටොන් 3832 ක් නිපදවන ලදි.

පරීක්ෂණයට ලක් වී ඇති අවුරුද්ද තුළ රජයේ අළුත් ව්‍යාපාරයන් අතුරෙන් සමහරක් නිෂ්පාදනය ඇරැඹි අතර, සමහරක් තවමත් ගොඩනැගිලි අවස්ථාවෙහිම වෙයි. තවත් සමහරෙක සැලසුම් සකස් කොට අවසන් කරන ලදි. ජාතික රෙදිපිළි සංයුක්ත මණ්ඩලය හා කන්තලේ සීනි සංයුක්ත මණ්ඩලය, නිෂ්පාදනය පටන් ගත්ව්‍යාපාර වලින් සැලකිය යුතු දෙකකි. මේ කර්මාන්ත ශාලා දෙකෙහිම නිෂ්පාදන කටයුතු 1961 දී පටන් ගන්නා ලදි. ජාතික රෙදි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට රුපියල් හාර කෝටි දශ ලක්ෂයක් වැය වන කර්මාන්ත ශාලා දෙකක් අයත්වනු ඇත. මෙයින් එකක් සඳහා මෙරටින් මුදල් සොයා ගනු ලබන අතර අනෙක සඳහා මහජන චීන සමූහාණ්ඩුවෙන් ආධාර ලැබේ පළමුවන කර්මාන්තශාලාව දැනටමත් කටයුතු පටන්ගෙන ඇති අතර, රාත්තල් 4,23, 324 ක නූල් නිපදවා තිබේ. මෙම නූල් අත් යන්ත්‍රවලින් රෙදි විවීම සඳහා ද, බැනියන් ආදිය විවීම සඳහාද උපයෝගී කර ගනී. මේ කම්හලේ රෙදි විවීම පිටරටින් නූල් ගෙන්වා පසුව අරඹනු ලැබේ දෙවැනි කර්මාන්ත ශාලාව 1963 දී වැඩ පටන් ගනු ඇතැයි අපේක්ෂා කැරේ.

කන්තලේ සීනි සංයුක්ත මණ්ඩලය එහි ගොඩනැගිලි අවස්ථාව 1960 දී අවසන් කළ ද, උක් දඬු හිඟය නිසා දුෂ්කරතාවකට මුහුණ පා ඇත. 1961 අවසාන වන විට මෙම කර්මාන්ත ශාලාවෙන් සීනි ටොන් 520 පමණ නිපදවා ඇත. මෙයට සම්බන්ධ ඉස්කාගාරයක් දැනට ඉදි කැරෙමින් පවතින අතර, එහි නිෂ්පාදන කටයුතු 1962 වන විට පටන් ගනු ඇතැයි අපේක්ෂා කැරේ. කෘෂිකාර්මික අංශයෙන් මතුවන දුෂ්කරතා මඟහැරලීම සඳහා මෙතෙක් වෙන් වෙන් අමාත්‍යාංශ යටතෙහි තුබූ උක් නිෂ්පාදනය හා කාර්මික කටයුතු ඒකාබද්ධ කරන ලදී. 1960 දී ගල්ඔය මණ්ඩලය යටතේ අම්පාරේ ඇති සීනි කර්මාන්ත ශාලාවෙහිද නිෂ්පාදන කටයුතු අරඹන ලදී. 1961 අවසාන වන විට මෙහි සීනි ටොන් 2472 නිපදවා තිබිණි.

කාර්මික වතු සංයුක්ත මණ්ඩලයෙහි ද ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයෙහි ද, ගොඩනැගිලි කටයුතු දැනට අරඹා ඇත. 1962 දී මේවායේ නිෂ්පාදන කටයුතු ඇරැඹේතැයි අපේක්ෂා කැරේ.

තුන් වැනිව ලංකා වානේ සංයුක්ත මණ්ඩලය හා ටයර් හා ටියුබ් සංයුක්ත මණ්ඩලය යනුවෙන් විශාල යෝජනා ක්‍රම දෙකක් වෙයි මේ යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය ණය එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවෙන් ගනු ලැබේ. මින් පළමුවැන්න සඳහා රුපියල් අට කෝටියක්ද, දෙ වැන්න සඳහා රුපියල් පත් කෝටි දහත් ලක්ෂයක් ද මූලික වියදම් ලෙස වැය වෙයි. වානේ කම්හල දැනට එහි ප්‍රථම අවස්ථාවෙහිම වැඩ අරඹා ඇත. මෙයට පදම් කරන මෝලක් සහ කම්බිකූරු නිපදවීම ඇතුළත් වෙයි. මේවායේ මූලික අවස්ථා සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය පිටරටින් ගෙන්වා ගනු ලැබේ. ටයර් හා ටියුබ් යෝජනා ක්‍රමය 1964 දී නිමා වේ යැයි අපේක්ෂා කැරේ. ලංකාවේ රාජ්‍ය අංශයෙහි තෙල් පිරිසිදු කිරීමේ යන්ත්‍රයක්, සහ පෝර කම්හලක් පිහිටුවීම සඳහා රජය දැනට විදේශීය රාජ්‍යයන් හා ආයෝජකයන් සමග සාකච්ඡා පවත්වාගෙන යයි.

**පෞද්ගලික අංශය - ප්‍රතිපත්තිය**

රජය පෞද්ගලික අංශය සඳහා අනුගමනය කරන ප්‍රතිපත්තිය (1) නැවත වරක් ප්‍රකාශයට පමුණුවා, පෞද්ගලික කර්මාන්තකරුවන්ට ආධාර දීම හා කර්මාන්ත අනුමත කිරීම සඳහා වූ පාලන යන්ත්‍රය ද වැඩි දියුණු කරන ලදී. දැනට කර්මාන්ත සංවර්ධනය සඳහා පහත දැක්වෙන අයුරින් පෞද්ගලික අංශය දිරි ගන්වනු ලැබේ.

(අ) ලාභ, අඩ වශයෙන් හෝ, සම්පූර්ණයෙන් හෝ බද්දෙන් නිදහස් කිරීම

(ආ) දරන ලද වියදම්හි සියයට ගණනක් වනතෙක් ආයෝජන ආදායම් බද්දෙන් නිදහස් කැරෙන සංවර්ධන ප්‍රතිදාන

(ඇ) ක්ෂය වීම් දීමනා

(ඈ) උපකරණ හා අමුද්‍රව්‍ය සඳහා අනුග්‍රහ තීරු ගාස්තු

(ඉ) සුළු පාරිභෝගික කර්මාන්ත පිහිටුවීම සඳහා පෞද්ගලික ප්‍රාග් ධනයට අතිරේක වශයෙන් රජය ද ප්‍රාග් ධනය යෙදවීම.

(ඊ) කර්මාන්ත සඳහා ණය දීම

(උ) ලංකාවේ විද්‍යා හා කාර්මික පර්යේෂණ ආයතන මඟින් හා සුළු කර්මාන්ත හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් කාර්මික ආධාර දීම

(ඌ) ආනයන සීමා කිරීම, තීරු බදු ගැලපීම්, කාර්මික නිෂ්පාදන (රෙගුලාසි) පනතින් මෙරට නිෂ්පාදකයා ආරක්ෂා කිරීම,

(එ) රජය විසින් භාණ්ඩ මිල දී ගැනීම.

කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍යව ඇති විදුලි බලය, ගමනාගමනය හා කාර්මික අධ්‍යාපනය වැනි මූලික පහසුකම් දියුණු කිරීම සඳහා තව දුරටත් රජය විසින් මුදල් යොදා ඇත.

(1) ආයෝජකයන්ට උපදෙස්:- පළමුවැනි විවරණිකාව - පළමුවැනි කාණ්ඩය කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධන අංශය විසින් නිකුත් කරන ලදී.

කර්මාන්ත සංවර්ධනය සඳහා මෙරට ඇති ධන මාර්ග වලට පරිපූරක වශයෙන් පෞද්ගලික විදේශීය ප්‍රාග් ධනය හා කාර්මික දැනුම ලබාගැන්මෙහි වැදගත්කමවටහා ගත් රජය විසින් 1960 – 61මුදල් ඇමතිවරයාගේ අය – වැය කථාවෙන් පෞද්ගලික විදේශීය ප්‍රාග් ධනය පිළිබඳ ව රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පමුණුවන ලදී. මෙරට විදේශීය ප්‍රාග් ධනය පිළිගනුයේ කුමන කොන්දේසි යටතේ ද යන්න එහි සඳහන් කැරිණ. මේ ප්‍රකාශයෙන් විදේශය ප්‍රාග් ධනයට ද මෙරට ප්‍රාග් ධන සඳහා සලසන බදු, තීරු බදු හා අනෙකුත් පහසුකම් සැලසීමට රජය එකඟවී ඇත මීට අතිරේකව පහත සඳහන් පොරොන්දු රජය විසින් දෙන ලදී.

(1) ලාභාංශ ආපසු ගෙනයාමට හා අන්තිමේදී වත්කම් ආපසු ගෙනයාමට නිදහස්ව ඉඩ දීම.

(2) අවශ්‍ය කාර්මික හා පාලන කාර්ය මණ්ඩල ගෙන ඒමට නිදහස්ව ඉඩ දීම

(3) එසේ එන අයට ඔවුන්ගේ ඉපැයීම් වලින් කොටසක් පිටරට යැවීමට ඉඩ දීම

(4) දෙරට රජයන් අතර ඇති කරගත් ගිවිසුම් මඟින් ද්විත්ව බදු අයකිරීම වැළැක්වීමට විධිවිධාන සැලැසිය යුතු යැයි ප්‍රතිපත්තියක් වශයෙන් රජය පිළිගැනීම.

## පාලන යන්ත්‍රය ප්‍රතිසංවිධානය කිරීම

රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සංවර්ධන සැලැස්ම පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් කර්මාන්ත අමාත්‍යංශයෙහි සංවර්ධන අංශය යනුවෙන් අළුත් අංශයක් පිහිටුවනු ලැබීය. ජාතික කර්මාන්ත සැලැස්මේ අංශයක් වී ඇති සුළු කර්මාන්ත හා ගෘහ කර්මාන්ත දියුණු කිරීම සඳහා පාලන යන්ත්‍රය ශක්තිමත් කිරීමේ අටියෙන් අතිරේකව තවත් විධිවිධාන තුනක් සම්මතකොට ඇත. මේ අනුව සුළු කර්මාන්ත හා ගෘහ කර්මාන්ත මණ්ඩලයක් ද, සුළු කර්මාන්ත සේවා ආයතනයක් ද, ගෘහ කම්හාන්ත සඳහා ණය සැපයීම හා ඒවායේ පරිපාලනය සඳහා ක්‍රමයක් ද, පිහිටුවීමට යනු ලැබේ.

මෙවැනි දිරිදීම්වලට හා ආයතනවල ඇති කැරුන වෙනස්කම් වලට අතිරේකව ගෙවුම් ශෙෂය පිරිහීම නිසා පනවන ලද ආනයන සීමා කිරීම්, 1961 මෙරට නිෂ්පාදන වාතාවරණය වෙනස් කිරීමෙහි ලා සැලකිය යුතු හේතුවක් විය. 1960 ආනයන සීමා කිරීම් වශයෙන් එනෙක් සාමාන්‍ය බල පත්‍ර උඩ ගෙන්වන ලද බොහෝ භාණ්ඩ සඳහා පරිමා සීමාවන් ඇති කිරීම සහ පෞද්ගලික බල පත්‍ර නිකුත් කිරීම් ඇති විය. 1961 දී මේ භාණ්ඩ බොහෝ ගණනෙක් ගෙන්වීම තාවකාලිකව අත්හිටවන ලදී. නැතහොත් දැඩි ලෙස කපා හරින ලදී. ආනයන සීමා කිරීමෙන් මෙරට කම්හාන්ත සඳහා රජය විසින් උදව් දීම නිසා පිටරටින් ගෙන්වන භාණ්ඩ වෙනුවට මෙරට භාණ්ඩ නිපදවීම සඳහා කම්හාන්ත ඇරැඹීමට පෙළඹවීමක් ඇති විය.

## පෞද්ගලික දේශීය ආයෝජන

1960 මැයි මස සිට 1961 නොවැම්බර් කාලය තුළ දී සංවර්ධන අංශය විසින් නොයෙක් අංශවල කාර්මික ව්‍යාපාර ගණනාවක්ම අනුමත කරන ලදි.* මීට අතිරේකව, ප්‍රතිපත්තියක් වශයෙන් අනුමත කළ යෝජනා ක්‍රම ද ඇත. එනම්, කොටස් එකතුකොට මෝටර් රථ සෑදීම සහ තවමත් සැලකිල්ලට භාජන වී ඇති යෝජනා ක්‍රම. ඉහත සඳහන් ව්‍යාපාරයන්හි ආයෝජන කිරීමට බලාපොරොත්තු වන මුළු මුදල රුපියල් පන්කෝටි හැත්තෑ ලක්ෂයක් පමණ වනු ඇත. එහෙත් මේ ආයෝජන වලට ගැනෙන ප්‍රාග්ධන එකතුව මෙයට වඩා වැඩිය. ඉහත සඳහන් ලැයිස්තුවේ කැපී පෙනෙන අංගයක් වනුයේ පිටරටින් අමු ද්‍රව්‍ය ගෙන්වා මෙරට නිපදවන පාරිභෝගික භාණ්ඩ සංඛ්‍යාව වැඩි වීමය. මෑතදී පටන් ගත් ඇඳුම් සෑදීම හා බිස්කට් සෑදීම වැනි ව්‍යාපාර සඳහා අනුමැතිය ලැබී ඇත්තේ සමාලොචනයට භාජනය වන කාලය තුළදී නොවන හෙයින් ඒවා ඉහත ලැයිස් තුවට ඇතුළත් නොකරන ලදී.

## විදේශීය ආයෝජන (පෞද්ගලික)

ඉහත දැක්වූ සමහර යෝජනා ක්‍රමවලට විදේශීය ධනය යොදා කෙරෙන ව්‍යාපාරයන් ද ඇතුළත් වෙයි. රජය විසින් විදේශීය ආයෝජන අයැදුම් ඇත් සලකා බැලීම සඳහා පත් කරන ලද කමිටුව පහත දැක්වෙන කර්මාන්තයන්හි විදේශීය මුදල් ආයෝජනය අනුමත කොට ඇත. ගුවන් විදුලි යන්ත්‍ර වායු සමීකරන, ශීත කරණයන්, සයිකල් හා බූමිතෙල් උදුන්, ඇනමල් භාජන, ගැල්වනයිස් භාණ්ඩ, මෝටර් රථ අමතර කොටස් හා උපකරණ, කාර් බැටරි, තීන්ත හා වාර්නිස් වර්ග, දත් බේත්, ටොයිලට් වර්ග, කෘත්‍රිම පටපිළි විවීම හා නිමැවීම, මේ ව්‍යාපාර සඳහා ඇදී එන විදේශීය ප්‍රාග්ධනය රුපියල් හැත්තෑ ලක්ෂයක් පමණ වේ. මෙසේ ප්‍රාග්ධනය සපයන ප්‍රධාන රටවල් වනුයේ එක්සත් රාජධානිය, එක්සත් ජනපදය හා ජපානය යන රටවල්ය. තවත් ආයෝජන කිහිපයක් සැලකිල්ලට භාජන වෙමින් පවතී. ඉහත දැක්වෙන ලැයිස්තුවෙන් මෙම කාලය තුළ ලංකාවේ ආයෝජන කරන ලද විදේශීය ප්‍රාග්ධන මුළු ප්‍රමාණය නොදැක්වේ. මෙයට මෙහි ඇති විදේශීය ව්‍යාපාරයන් ඒවායේ ලාභ නැවත ආයෝජන කිරීම ඇතුළත් කර නැත.

## සංවර්ධන මුදල් සමායතනයේ සහභාගිත්වය

සංවර්ධන මුදල් සමායතනයේ කටයුතු වලින් ද පෞද්ගලික අංශයේ කර්මාන්තවල ඇති වූ දියුණුව මැනගත හැකිය. මෙම සමායතනය එහි කටයුතු අරඹන ලද්දේ, 1956 දී ය. සංවර්ධන යෝජනා ක්‍රමවලට නොයෙක් අයුරින් එය සහභාගි විය. 1961 දෙසැම්බර් අවසාන වන විට එය රුපියල් දෙකෝටි හතළිස් හත්ලක්ෂයකින් එවැනි යෝජනා ක්‍රමවලට සහභාගි වී තුබුණි. එය මුළුමණින් වාගේ මුදල් ආයෝජනය කොට ඇත්තේ කර්මාන්තයන්හිය. සමායතනය සාමාන්‍ය යෙන් පෞද්ගලික ආයෝජනයන් යොදන ප්‍රමාණයටම මුදල් යොදන බැවින් සංවර්ධන මුදල් සමායතනයට සම්බන්ධිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් හාරකෝටි අනූහතර ලක්ෂයක් පමණ වේයැයි ගණන් බලා තිබේ.

---

* මේ ව්‍යාපාරවලට කෘත්‍රිම පටපිළි විවීම හා නිමැවීම, දැලි තල, ශීතකරණ, සපත්තු හා බිම් පොලිෂ්, සපත්තු ක්‍රීම් ආදිය නිෂ්පාදනය ද, ඔරලෝසු- අත් ඔරලෝසු, මහන යන්ත්‍ර පවුන්ටන් පෑන්, කාබන් කඩදාසි, පොලියෙස්ටර් බොත්තම්, සිල්නබන ඉටි, ප්ලාස්ටික් භාණ්ඩ, ගිණිකෙළි භාණ්ඩ, කෘත්‍රිම ආභරණ, විදුලි පංකා, බීර, අකුරු සහිත හෝ රහිත ලෝහ බඳුන් මහන නූල්, සඳුන් කූරු, කපුරු, මුද්‍රණ තීන්ත, පාවහන්, ගැල්වනයිස් භාණ්ඩ, පාර්සල් බැඳීමේ දී යොදන සණ නූල්, සූට්කේස්, තුත්තනාගම්, භාජන, භූමිතෙල් උදුන් හා ලිප් ඇස් කන්නාඩි රාමු, ජෑම්, සෝස් වර්ග, පළතුරු යුෂ, කුඩ, ඇස්බැස්ටෝස්, සිමෙන්ති භාණ්ඩ, අල්පෙනෙත්ති හා කිලිප්, බුමුතුරුණු, මේස මත ආවරණය සඳහා යොදන ද්‍රව්‍ය, චොකලට්, ද්‍රව ඉස්තුරුප්පු, කම්බි ඇන, සහ පනේල ඇණ, සොයිබ හා මුරිච්චි, ඖෂධ, බඩු ගෙන යන මෝටර් සහිත ට්‍රයිසිකල්, සබන්, සෙල්ලම් බයිසිකල්, වීදුරු නහඹු සුරුට්ටු, ටයර් පිරවීම, බ්‍රේසියර් ඇඳුම්, බිම් උළු, තීන්ත වර්ග, විදුලි බල රාශි කාරණයන්, රස කැවිලි වර්ග, නාන කාමර අවශ්‍යතා හා රූපලාවන්‍යයට අවශ්‍ය දේ, ගොඩනැගිලි ද්‍රව්‍ය හා වයර් හා කේබල් සෑදීම,

ලංකාවේ කාර්මික පදනම මෙසේ පුළුල්වීමේත්, ශක්තිමත්වීමේත්, සාක්ෂි ඇති වුවද, ක්‍රමානුකූලව හා පරීක්ෂාකාරිව සියලු ධන මාගී උපයෝගී කර ගැනීමෙන් කර්මාන්ත වර්ධනයේ ශීඝ්‍රතාව තව දුරටත් වැඩි කිරීම අවශ්‍ය බව පෙනී යයි. මෙය වඩාලාත්ම අවශ්‍ය වී ඇත්තේ රැකීරක්ෂා හිඟය වැඩිවෙමින් පවතින නිසා හා අපේ විදේශීය ගෙවීම් තත්ත්වය පිරිහෙමින් පවතින නිසාත්ය.

## ප්‍රාදේශීය සහයෝගතාව

කාර්මික සංවර්ධනයේ වේගය වැඩි කරලීම සඳහා ගතයුතු පියවර අතුරින්, අනිකුත් ආසියානු රටවල් සමග කිට්ටු ආර්ථික සහයෝගීතාවක් ඇති කරලීමට උත්සාහ දැරීම ද එකකි. වෙළෙඳාම, කර්මාන්ත, කෘෂිකර්මය, ගමනාගමන හා පරිවාහන, පිළිබඳ ප්‍රාදේශීය සහයෝගීතාම දියුණු කර ලීමට ආසියාවේ සහයෝගතා සංවිධානයක් ඇති කිරීමට ලංකාරජය ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වී ඇත.

## ජාත්‍යන්තර සංවර්ධන සමාගම

1961 ජූනි මාසයේ දී ලංකාව, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම නිසා ලංකාවේ කාර්මික සංවර්ධනය වැඩි දුරට දියුණු කර ගත හැකිය. ජාත්‍යන්තර, සංවර්ධන සමාගම ජාත්‍යන්තර, ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවට බඩ ආයතනයක් ලෙස අරඹා ඇත. මෙයින් අතිරේක විදේශීය මුදල් සහ කාර්මික ආධාර අඩු දියුණු රටවල සංවර්ධන යෝජනා ක්‍රම සඳහා යෙදවීමට උදව් දෙන අතර, මේ ආධාර සිරිත් පරිදි ලබන ආධාර මෙන් නොව ඊට පහසු වූ ද ගෙවුම් ශේෂයනට එතරම් පීඩාකර නොවූ ද ක්‍රම අනුව දෙනු ලැබේ. ලංකාවට වෙන් කර ඇති ල් දශක මුදල ඩොලර් කෝටි 303 කි.